# 6 ශ්‍රේණිය

# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

## ඒකකය 4

## යෙදුම් මෘදුකාංග භාවිතය සඳහා මූසිකය හා යතුරු පුවරුව යොදා ගැනීම.

කියවීම් ද්‍රව්‍ය







# යෙදුම් මෘදුකාංග

# යෙදුම් මෘදුකාංග (Application Software) යනු ?

- පරිගණකය මගින් එදිනෙදා පරිශීලක අවශ්‍යතා ඉටුකර ගැනීමේ දී ඒ සඳහා යොදා ගනු ලබන විවිධ වැඩසටහන් ය.



# චිත්‍රක මෘදුකාංග (Graphic Software)

- චිත්‍ර හා රූප සටහන් පරිගණකය ආධාරයෙන් ඇඳීමට භාවිත කරන මෘදුකාංග.

උදා-

1. MS Paint
2. Tux Paint
3. Gimp
4. Adobe Photoshop
5. Adobe Illustrator
6. Dmartdraw

# වදන් සැකසුම් මෘදුකාංග (Word Processing Software)

- ලිපි ලේඛන ආදිය සැකසීමට භාවිත කරන මෘදුකාංග.

| මෘදුකාංගයේ නම | නිශ්පාදන ආයතනය |
|---|---|
| AbiWord | Source Gear Corporation |
| FrameMaker | Adobe Systems Incorporated |
| iwork | Apple |
| King soft Office | King soft |
| LibreOffice Writer | The Document Foundation ( Open Source ) |
| LyX | The LyX Project |
| Microsoft Office Word | Microsoft Corporation |

- ලේඛන සකස් කිරීම සහ සංස්කරණය කිරීම ( Creating and Editing)
- අකුරු හැඩසවීම (Formatting)
- වස්තූන් එකතු කිරීම (Insert objects such as Images)
- තැන්පත් කිරීම සහ විවෘත කිරීම( Saving and retrieving)
- පෙර දැකුම බලා ගැනීම සහ මුද්‍රණය කිරීම ( Print Preview and Printing )
- අක්ෂර වින්‍යාසය සහ ව්‍යාකරණ දෝෂ සෙවීම සහ නිවැරදි කිරීම (Spell checking & Grammer )
- වචන සෙවීම සහ වෙනත් වචන ඒ වෙනුවට ප්‍රතිස්ථාපනය කිරීම( Find and replace )වැනි පහසුකම් රැසක් ද සපයා ඇත

# කෙටිමං යතුරු (Shortcut Keys)

පරිගණකය ආශ්‍රිතව කරනු ලබන කාර්යයන් වේගවත්ව කිරීම සඳහා කෙටිමං යතුරු භාවිතා කරනු ලබයි. වදන් සැකසීමේ මෘදුකාංගයේ දී භාවිත වන කෙටිමං යතුරු කිහිපයක් සහ ක්‍රියාකාරිත්වයන් පහතින් දක්වා ඇත.

| කෙටිමං යතුර | ක්‍රියාකාරිත්වය |
|---|---|
| Ctrl + N | නව ලේඛනයක් ලබා ගැනීමට |
| Ctrl + S | ලේඛනයට නමක් යොදා තැන්පත් කිරීමට |
| Ctrl + O | ලේඛනය විවෘත කිරීමට |
| Ctrl + A | ලේඛනය තේරීමට |
| Ctrl + C | අකුරු / වස්තූන් පිටපත් කිරීමට |
| Ctrl + X | අකුරු / වස්තූන් කැපීමට |
| Ctrl + V | අකුරු / වස්තූන් ඇලවීමට |
| Ctrl + H | වචන ප්‍රතිස්ථාපනය කිරීමට |
| Ctrl + HOME | කර්සරය ලේඛනයේ මුලට ගැනීමට |
| Ctrl + END | කර්සරය ලේඛනයේ අවසානයට ගැනීමට |

# ශ්‍රව්‍ය සංස්කරණ මෘදුකාංග (Audio Editing Software)

- ශබ්ධය/හඬ සංස්කරණය සඳහා භාවිත කරන මෘදුකාංග.

උදා-

1. Audacity
2. Adobe Audition
3. Power Sound Editor
4. AVS Audio Editor
5. Studio One

# දෘශ්‍ය සංස්කරණ මෘදුකාංග (Video Editing Software)

- හඬ/රූප සංස්කරණය සඳහා භාවිත කරන මෘදුකාංග.

උදා-

1. Adobe Premiere
2. Windows Movie Maker
3. Super DVD Video Editor
4. Vegas
5. Power Director

# ශ්‍රව්‍ය/දෘශ්‍ය සංස්කරණයේ දී භාවිත කළ යුතු ආචාර ධර්ම

- අන් අයගේ හඬ/රූප යොදාගන්නා විට ඔවුන්ගෙන් අවසර ලබා ගැනීම.
- අන් අයගේ හඬ/රූප යොදාගන්නා විට ඔවුන්ගේ අනන්‍යතාව ආරක්ෂා කිරීම.
- අසත්‍ය අදහස් හෝ පණිවිඩ ජනනය වන අයුරින් සංස්කරණය සිදු නොකිරීම.
- සංස්කරණ කටයුතු වංචනික ක්‍රියා සඳහා භාවිත නොකිරීම.